# දේවතිස්ස රජමහා විහාරයේ ශිලා ලේඛන තුළින් හෙළිවන සමකාලීන සමාජය පිළිබඳ අධ්‍යයනයක්

එච්.එම්.ඩබ්.ජී. නිරෝෂන් විජේරත්න[1]

අතීත මානවයා ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා විවිධ උපක්‍රම භාවිතා කර ඇත. ඒ අනුව විවිධ ද්‍රව්‍යය උපයෝගී කරගෙන තම අදහස් ලේඛනය කළ අතර ඒවා අභිලේඛන ලෙස හඳුන්වාදිය හැකිය. අභිලේඛනවල වැදගත්කම වන්නේ ඒවා සමකාලීන වීමක් තවෙකුගේ සිතගි පරිදි වෙනස් කිරීමට භාජනය කරනු ලැබුවහොත් ඒ බව සැගවීම අපහසු වීමත්ය. මෙම පර්යේෂණය තුළින් මහ ඇළගමුව විහාරය ආශ්‍රිතව පවතින ශිලා ලේඛන ඇසුරින් හෙළිවන සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලනය තොරතුරු පිළිබඳව අධ්‍යයනය කිරීම පර්යේෂණ අරමුණ වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර ගවේෂණය හා ක්ෂේත්‍ර නොවන ගවේෂණය ඔස්සේ දත්ත රැස්කිරීම සිදු කරන ලදි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇළගමුව ග්‍රාම සේවා වසම තුළ පිහිටා ඇති මෙම විහාරය දෙවනපෑතිස් රජුගේ නිර්මාණයක් බවට මතයක් පළ වුවද එය පුරාවිද්‍යාත්මක සාධකවලින් සනාථ වී නොමැත. ක්‍රිස්තු වර්ෂ 5-7 සියවස්වලින් අනතුරුව මෙම විහාරයේ පැවැත්ම පිළිබඳ සාධක හමු නොවන අතර ක්‍රිස්තු වර්ෂ හත අට සියවස්වලදී මෙය විහාරය අතහැර දමා තිබේ. මෙහි කටාර කෙටූ ලෙන් විසිහතක් ද කටාර නොමැති ලෙන් හතක් ද වේ. ලෙන් ලිපි, පර්වත ලිපි මෙම විහාරයේ දැකිය හැකි අතර, ලෙන් ලිපි පූර්ව බ්‍රාහ්මී හා අපර බ්‍රාහ්මී ලිපි වේ ක්‍රි.පූ තුන් වැනි සියවසට අයත් ගිරි ලිපි තුනක් ද මෙහි වේ. තව ද දහනව වැනි සියවසට අයත් කුඩා ලිපි දෙකක් හා අත් ලිපි දෙකක් වේ. මෙම ශිලා ලිපි පිළිබඳ අධ්‍යයනය කිරීමේදී විවිධ පදවි නාම අතර මහරජ, ගණක - කොටගරික වැනි තනතුරු නාම සඳහන් වීම තුළ පැහැදිලි වන්නේ එකල සමාජය තුළ අධ්‍යාපනයට ආර්ථිකය ද ඉහළ තත්ත්වයක තිබුණ බවට දක්නට ලැබීමය. මෙම ලිපි අතර සමාජ කණ්ඩායම් ලෙස කුටුබික - නබතික, පරුමක, බත, ගපති යන නාම හඳුනාගත හැකිය. එගින් සමාජ විෂමතාවය පිළිබඳ අනාවරණය වේ. එසේම එකල සමාජය තුළ පැවති විවිධ වෘත්තීන් වන ආචාරිය යන නාමයන් පිළිබඳ තොරතුරු සඳහන් වේ. එසේම විශේෂ නාම අතර පුශ - තෙරහ, තිශරකිත, තෙරශ, බත යන නාමයන් පිළිබඳ තොරතුරු සඳහන් විහාරය තුළ දක්නට ඇති ශිලා ලේඛන අධ්‍යයන කිරීම තුළින් හඳුනාගත හැකිය.

**ප්‍රමුඛ පද :** අභිලේඛන, මහඇලගමුව, පදවිනාම, ලෙන්ලිපි, පර්වත ලිපි

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
niroshanvijerthnahmwg@gmail.com